# ශ්‍රී ලාංකීය දේශීය චිකිත්සාවේ සඳහන් සන්නි රෝග හා පහතරට සන්නි යකුම ශාන්තිකර්මයට අයත් සන්නි රෝග පිළිබඳ සංසන්දනාත්මක හා විමර්ශනාත්මක අධ්‍යයනයක්

සුමනවීර අයි වයි ජී එම් එස්[1], වික්‍රමාරච්චි ඩබ් ජේ[1]
[1]ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය

**සංක්ෂිප්තය**

සන්නි යනු එක්තරා තීව්‍රරෝග අවස්ථාවක් බව විද්වතුන්ගේ මතයයි. නමුත් ඒ පිළිබඳව දේශීය වශයෙන් හෝ ආයුර්වේදීය වශයෙන් රෝග විඥානීය අර්ථකථනයක් සිදුවී නොමැත. විවිධ දේශීය චිකිත්සා ග්‍රන්ථවල සන්නි විවිධ සංඛ්‍යා වලින් දක්වා ඇතත් ප්‍රධාන වශයෙන් දහ අටක් පිළිබඳ දක්වා ඇත. කෙසේ වෙතත් සන්නි රෝග වලට දේශීය චිකිත්සා ග්‍රන්ථ වල චිකිත්සා යෝග විශාල සංඛ්‍යාවක් දැක්වීමෙන් පෙනී යන්නේ සන්නි යනු ඉතා සුලබව පැවැති රෝග අවස්ථාවක් බවයි. දේශීය චිකිත්සාව තුල ඇතැම් ස්ථානවල සන්නි රෝග සන්නි යක්කු හා සම්බන්ධ කොට කියැවෙන අවස්ථා දැකිය හැක. ඒ අනුව සන්නි රෝග දේශීය භූතවිද්‍යා තන්ත්‍රය සමගද සම්බන්ධ බව පෙනේ. සන්නි යක්ෂයා ඇතුළු දහඅට සන්නි යක්ෂයින් විසින් ඇතිකරනු ලබන සන්නි වශයෙන්ම සඳහන් රෝග දහඅටක් ප්‍රසමනය උදෙසා කරනු ලබන ශාන්තිකර්මය සන්නි යකුම හෙවත් දහඅට සන්නිය නම් වේ. මෙයට අයත් සන්නි රෝග දහ අට පිළිබඳ විස්තර, කවි ,කෝල් මුර ගායනා වලින්ද ,එහි සාම්ප්‍රදායික වෙස් මුහුණු මගින්ද, රංගනයේ භාව නිරූපනයෙන්ද, භරතමුනිගේ නාට්‍ය සිද්ධාන්තයට අනුකූල ව නිරූපනය කෙරේ. මෙම සියලු අංගයන් කැටිකර ගත් විට පෙනී යන්නේ සන්නියකුම යනු දේශීය චිකිත්සාවේ බලපෑමෙන් ස්වායක්ත වූ හුදු ඇදහිල්ලක් පමණක්ම නොව එමගින් කියැවෙන සන්නි රෝග දේශීය චිකිත්සාවේ සඳහන් වන කිසියම් සන්නි රෝග සමූහයකට සමාන වියහැකි බවයි. තවද මෙම ශාන්ති කර්මය පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අංගයක් වන අතර ලොව පුරා අවධානයටත් සමාජ විද්‍යාත්මක අධ්‍යනයන්ටත් ලක්ව තිබෙන, වර්තමානයේ පවා ලෙඩ රෝග සුව කිරීම සඳහා බහුල ව යොදා ගැනෙන සංස්කෘතික උරුමයකි. මෙම ශාන්ති කර්මයට අයත් සන්නි රෝග පිළිබඳ විස්තර අඩංගු කවි, කෝල් මුර ගායනා, වෙස් මුහුණු වල රූපමය අර්ථයන් (ආහාර්ය අභිනය) හා රංගනයේ භාවනිරූපනය යන අංග විශ්ලේෂනය කොට එහි දක්වා ඇති සන්නි රෝග දේශීය සන්නි රෝග සමග සංසන්දනාත්මක ව හා විමර්ශනාත්මක අධ්‍යයනය කිරීමට මෙයින් අපේක්ෂා කෙරුනි. මෙම අධ්‍යයනයේ දී සන්නි යකුමේ භූත විද්‍යාත්මක පැතිකඩ බැහැර කෙරුනු අතර වඩා ප්‍රචලිත බෙන්තර සම්ප්‍රදායේ සන්නි දහ අට යොදා ගැනුනි. කෙසේ වෙතත් මුලින් සඳහන් නිර්නායක වලට අනුකූලවන පරිදි දත්ත ලබාගත හැකිවූයේ සන්නි රෝග අටක පමණි. ඒඅනුව පිළිවෙලින්, සන්නි යකුම ශාන්තිකර්මය තුල දැක්වෙන වෙඩි සන්නිය, අමුක්කු සන්නිය, කොර සන්නිය, ගිනිජල් සන්නිය, ගුල්ම සන්නිය, වාත සන්නිය, දේව සන්නිය යන රෝග පිළිවෙලින්, දේශීය චිකිත්සාවෙහි වෙඩි සන්නිය, අමුක්කු සන්නිය, කිරිමි සන්නිය, අග්නි සන්නිය, ගුල්ම සන්නිය, වාත සන්නිය, දේව සන්නිය යන රෝග සමග බෙහෙවින් සමානවූ අතර සන්නි යකුම ශාන්තිකර්මය තුල දැක්වෙන කෝළ සන්නිය, දේශීය චිකිත්සාවෙහි කෝළ සන්නිය සමග සැලකිය යුතු මට්ටමේ සමානතාවයක් දක්වයි. එනම් මෙම අධ්‍යයනය තුළින් සන්නි යකුමේ දැක්වෙන සන්නි රෝග, ලක්ෂණානුසාරයෙන් දේශීය චිකිත්සාවේ එම රෝග ලක්ෂණ සමඟ හොඳින්ම ගැලපුණු අතර ඇතැම් විටෙක දේශීය චිකිත්සා ග්‍රන්ථ වලටත් වඩා රෝග ලක්ෂණ මැනවින් විදහා පා ඇති බව පැහැදිලි විය. තවද එම පද්ධතීන් දෙකට අයත් කවි සංසන්දනය කිරීමෙන් පෙනී යන්නේ ඒවා බෙහෙවින් සමාන හා බොහෝ විට එකම මූලාශ්‍රයකින් ව්‍යාප්ත වන්නට ඇති බවයි.

**ප්‍රමුඛ පදඃ** සන්නි යකුම, සන්නි රෝග, කෝල්මුර ගායනා, ශාන්තිකර්ම, රංගනයේ භාවනිරූපනය